පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

2 තේමාව

# 5 ශ්‍රේණිය

# අපි ලක්වැසියෝ






## ශ්‍රී රුවන් තිළිණ

ශාස්ත්‍රවේදී, NCT සිවිල් ඉංජිනේරු, රජයේ පාසල් ආචාර්ය 071 66 84 251

# 02. අපි ලක් වැසියෝ



රටේ අභිමානය සුරකින
දේශයට හිතැති
ශ්‍රී ලාංකිකයෙකු බිහිකිරීම
අපගේ ඒකායන අරමුණයි.

## අපේ ජාතික කොඩිය

මේ අපේ ජාතික කොඩිය ගැන තොරතුරුයි. එහි රතු, කහ, කොළ, තැඹිලි යන වර්ණ 4 ක් තිබේ.



### ජාතික කොඩියේ ඇති සංකේත හා වර්ණවල තොරතුරු

- ★ රතු පැහැති පසුබිම :-
  ජාතික අභිමානය
- ★ කහ පැහැති සිංහ රූපය :-
  එඩිතර සිංහල ජාතිය නියෝජනය කිරීම
- ★ තැඹිලි පාට, කොළ පාට තීරු :-
  දමිළ, මුස්ලිම් ඇතුළු අනෙකුත් ජාතීන් නියෝජනය කිරීම
- ★ මුළු කොඩිය වට කර යෙදූ කහ පාට තීරුව :-
  කොඩියේ නිමාව මෙන් ම ජාතීන් අතර එකමුතු බව
- ★ කොඩිය ඇතුළත බෝ කොළ සතර :-
  මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ



සම්මත ජාතික කොඩියක දිග, පළල මෙන් දෙගුණයකි.

## ❋ ජාතික කොඩිය ඔසවන අවස්ථා

- ★ නිදහස් දින උත්සවයේ දී / ජාතික උත්සවයේ දී
- ★ දෙස් විදෙස් රාජ්‍ය නායකයන් පිළිගැනීමේදී
- ★ පාසල් උදය රැස්වීමේ දී
- ★ වෙනත් විශේෂිත ජාතික උත්සවවල දී



## ❋ ජාතික කොඩිය අඩකුඹු කරන අවස්ථා

- ★ රාජ්‍ය නායකයෙක් මිය ගිය විට
- ★ ජාතික විපතක දී
- ★ ජාතික ශෝක දිනවල දී

## ❋ ජාතික කොඩිය වැරදි ලෙස භාවිතා වන අවස්ථා

- ★ ක්‍රීඩා තරඟවල දී කරේ දමා නැටීම.
- ★ ජාතික කොඩිය ශරීරයේ චිත්‍රණය (tatoo) කර ගැනීම.
- ★ මංගල අවස්ථාවල දී සිරස් අතට එල්ලෙන්නට දැමීම.
- ★ ඉරුණු ජාතික කොඩි එසවීම.

## ❋ ජාතික කොඩිය එසවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- ★ ජාතික කොඩිය ඔසවන අවස්ථාවේ දී එහි සිටින සියලුම දෙනා සීරුවෙන් සිටීම.
- ★ වෙනත් ජාතික කොඩි සමඟ ජාතික කොඩිය ඔසවන විට කොඩිවලට ඉහළින් හෝ සමානව සිටින සේ ජාතික කොඩිය එසවීම.
- ★ ජාතික කොඩිය තිරස් අතට සිටින සේ පමණක් එසවීම.
- ★ ජාතික කොඩිය ඔසවන අවස්ථාවේ දී ජාතික ගීය අභිමානයෙන් යුතුව ගායනා කිරීම හෝ අනුවාදනය කිරීම.
- ★ ජාතික ගීය ගායනය හෝ අනුවාදනය අවසන් වූ පසු හිස නමා ජාතික කොඩියට ආචාර කිරීම.

# අපේ ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී............. ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරි බරිනී සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්තී පූජා නමෝ නමෝ මාතා
අප ශ්‍රී............. ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා - ඔබමය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජයභූමි කරා
එක මවකගේ දරු කැල බැවිනා යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර දා නමෝ නමෝ මාතා
අප ශ්‍රී............. ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා

## අපේ ජාතික ගීය ගායනා කිරීමේ දී

- දෙපා දෑත් නිසි අයුරින් තබා ගැනීම.
- විලුඹ දෙක ළංවන සේ පාද මදක් ඈත් කර V අකුරේ හැඩයට තබා ගැනීම.
- හිස කෙළින් තබා ගෙන ඉදිරියේ ඇති එල්ලයක් කෙරෙහි දෙනෙත් විවෘත ව තබා ගැනීම. (ඇස් මට්ටමෙන් ඉදිරිය බැලීම)
- අත් දෙක පහළට ලිහිල් ව වැටෙන සේ අත මිට මොළවා මාපටැඟිල්ල පොළොව දෙසට යොමු වන සේ තබා ගැනීම. (ශරීරය සහ දෙඅත් අතර හිඩැසක් නොතිබිය යුතු ය.)



ආනන්ද සමරකෝන් මහතා

ශ්‍රී ලංකාවේ ජාතික ගීය රචනා කළේ ආනන්ද සමරකෝන් මහතායි. එය මුල් වරට ගායනා කරන ලද්දේ 1948 පෙබරවාරි 04 දිනායි.



# රාජ්‍ය ලාංඡනය හඳුනා ගනිමු.

රාජ්‍ය අයිතිය හඳුන්වන සංකේතය වන්නේ රාජ්‍ය ලාංඡනයයි. අද භාවිතා වන රාජ්‍ය ලාංඡනය වර්ෂ 1972 දී භාවිතයට ගත් රාජ්‍ය ලාංඡනයයි.

අපේ රාජ්‍ය ලාංඡනය නිර්මාණය
**එස්.එම්.සෙනෙවිරත්න**
මහතා විසින් සිදු කළා.



එස්.එම්.සෙනෙවිරත්න මහතා




## ❊ රාජ්‍ය ලාංඡනයේ පොදු අදහස

"ස්වයංපෝෂිත රටක ඉර, හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා..!"

## ❊ රාජ්‍ය ලාංඡනයේ සංකේත හා තේරුම්

- ★ පුන්කලසින් - සෞභාග්‍ය හා පරිපූර්ණ බව ද,
- ★ වී කරලින් - ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය ද,
- ★ කඩුවක් අතින් ගත් පලා පෙති වටය මැද සිටින සිංහයාගෙන් - රට හා විනය ගරුක ජනයා ද,
- ★ ධර්ම චක්‍රයෙන් - ධර්මය ද,
- ★ ඉර හඳ දෙකෙන් - සදාතනික පැවැත්ම ද මූර්තිමත් වේ.

## ❊ රාජ්‍ය ලාංඡනය දැකිය හැකි ස්ථාන

- ★ පාසල් පෙළ පොත්
- ★ රජයට අයත් වාහනවල
- ★ කාසිවල
- ★ උප්පැන්න සහතිකවල
- ★ රජයේ ලියකියවිලිවල
- ★ ජාතික හැඳුනුම්පතේ
- ★ ත්‍රිපෝෂ පැකට්ටුවල
- ★ රජයෙන් ලබා දෙන පොහොර උරවල
- ★ රාජ්‍ය ආයතනවල
- ★ රජයෙන් ලබා දෙන බෙහෙත් පෙට්ටිවල



රාජ්‍ය ලාංඡනයට, ජාතික කොඩියට සහ ජාතික ගීයට අමතරව ලෝකයේ විවිධ රටවල් තමන්ගේ රටේ අභිමානය, අනන්‍යතාව වෙනුවෙන් විවිධ සංකේත භාවිතා කරනවා.

## ශ්‍රී ලංකාවේ ජාතික සංකේත



- ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වළිකුකුළායි.
- ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නා ගසයි.
- ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය මානෙල් මලයි.
- ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වොලිබෝල්
- ශ්‍රී ලංකාවේ ජාතික සත්ත්වයා දඬුලේනායි.
- ශ්‍රී ලංකාවේ ජාතික මැණික නිල් මැණිකයි.

### ※ ජාතික පක්ෂියා - වලිකුකුළා



වලිකුකුළා ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික පක්ෂියෙකි. දෙමළ භාෂාවෙන් වලිකුකුළා ''කාට්ට කෝලි'' ලෙස හඳුන්වනු ලැබේ. කුඩා හිසක් හා ශක්තිමත් බෙල්ලකින් යුතු වලිකුකුළා ධාන්‍ය වර්ග හා කෘමි සතුන් අහුලා ගෙන කයි. වලිකිකිළිය වරකට බිත්තරය බැගින් දමයි. දිලිසෙන දුඹුරු පාට, අළු පාට හා කළු පාට වලිකුකුළාගේ ශරීර වර්ණ ලෙස දැක්විය හැකිය.

### ※ ජාතික වෘක්ෂය - නා



1986 පෙබරවාරි 26 වැනිදා කැබිනට් මණ්ඩලයේ තීරණයකට අනුව ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය ලෙස නා ගස නම් කරන ලදී. අටවිසි බුදු වරුන්ගේ එක් බුදුවරයෙකුට පිට දීමට යොදාගත් වෘක්ෂයක් බැවින් එය පූජනීයත්වයෙන් සලකනු ලබයි. නා ලීය ඉතා ශක්තිමත් බැවින් වැඩි නිසා ඉංග්‍රීසීන් විසින් එය අයන් වුඩ් (Iron Wood) ලෙස හඳුන්වනු ලදී. දෙමළ භාෂාවෙන් ''නාහමරම්'' ලෙස හඳුන්වන්නේ මේ නා ගසයි. නා ගස කේතුවක හැඩය ගනියි. ළපටි නා ශාක පත්‍ර පිරිත් කොටුවේ ඉහළ එල්ලීමට යොදා ගනියි. ඖෂධයක් ලෙස ද ප්‍රයෝජනවත් වන ශාකයකි. නා මල ඉතා සුවඳවත් පෙති හතරකින් යුතු මලකි.



## ❊ ජාතික පුෂ්පය - මානෙල් මල



මානෙල් මල ජලයේ වැවෙන දුර්ලභ ශාකයකි. නිලට හුරු දම් පැහැයක් මානෙල් මලෙහි දැක ගත හැකිය. නව පැළ හට ගැනීම සිදු වන්නේ කොළයේ මැදයි. මානෙල් ඉතා වටිනා ඖෂධයකි. ඉතා සුවඳවත් වූ මල මැද කහ පැහැති රේණු රාශියක් පිහිටා ඇත.

## ❊ ජාතික ක්‍රීඩාව - වොලිබෝල්



අපේ රටේ ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් 1985 දී ඇමරිකාවේ මුලින් ම ආරම්භ වූවකි. මුල්කාලීනව පිරිමි පක්ෂයට පමණක් සීමා වූ වොලිබෝල් ක්‍රීඩාව වර්ෂ 1964 දී ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයට ම පොදු වූ ක්‍රීඩාවක් ලෙස ඔලිම්පික් තරඟාවලියට පවා ඇතුළත් විය. වොලිබෝල් ක්‍රීඩාවේ දී ප්‍රගුණ කළ යුතු මූලික දක්ෂතා පහකි. පන්දුව පිරිනැමීම, පන්දුව එසවීම, පන්දුව හැසිරවීම, ප්‍රහාර එල්ල කිරීම හා ප්‍රහාර වැළැක්වීම යනු ඒවායි. එක් පිලකට ක්‍රීඩා කරන ක්‍රීඩකයන් සංඛ්‍යාව 12 කි. වොලිබෝල් ක්‍රීඩාව ශ්‍රී ලාංකාවට හඳුන්වා දෙන ලද්දේ වර්ෂ 1961 දී රොබට් වෝල්ටර් නම් ඇමරිකානු ක්‍රීඩා අධ්‍යක්ෂකවරයෙකු විසිනි.

## ❊ ජාතික සත්ත්වයා - දඬුලේනා



ශ්‍රී ලංකාවේ ජාතික සත්ත්වයා වන්නේ දඬුලේනායි. ශ්‍රී ලංකාවේ සෑම පළාතක ම පාහේ දැක ගත හැකි ය. තෙත් කලාපයේ දී බහුලව දැකිය හැකිය . සාමාන්‍ය ලේනෙකුට වඩා තරමක් විශාල ශරීරයකින් යුතු දඬුලේනා ඉතා අලංකාරවත් සතෙකි. ගස්වල ඇති පොල් ගෙඩි සියුම් දත්වලින් ලෙලි හැරගෙන කන්නට තරම් දඬුලේනා දක්ෂ ය.

## ❊ ජාතික මැණික - නිල් මැණික

අපේ ජාතික මැණික නිල් මැණිකයි. කපා ඔප දැමූ පසු ඉතා සුන්දරත්වයකින් යුතු නිල් මැණික මූල්‍යමය අතින් ද ඉතා වටිනා මැණිකකි. නිල් මැණික අපේ රටේ ජාතික මැණික (මාණික්‍ය) බවට පත් වීමෙන් අනතුරුව එය සැමරීමට තැපැල් මුද්දරයක් ද නිකුත් කොට ඇත.





# ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප

ශ්‍රී ලංකාවේ පළාත්වලට ඒ ඒ පළාත් සභාවල එකඟත්වය මත පළාත් පුෂ්ප නම් කිරීම සිදු වී ඇත.

## 1. උතුරු මැද පළාත

### ඇහැළ / ඇසළ



ඒකදේශික ශාකයක් වන මෙම ශාකය වියළි කලාපයේ බහුලව දක්නට ලැබේ. උද්‍යාන අලංකාර කිරීමට යොදා ගනී. ශ්‍රී දළදා මාලිගාවේ දැව සඳහා යොදා ගෙන තිබේ.

## 2. ද පළාත

### හීන්බෝවිටියා



ඒකදේශික ශාකයක් වන මෙය වියළි තෙත් හා කඳුකර කලාපවල බහුලව දක්නට ලැබේ. ඖෂධයක් ලෙස ද භාවිතා වන අතර, මීටර් 2 ක් පමණ උසට වැඩෙන පඳුරකි.

## 3. වයඹ පළාත

### ඇට්ටේරියා



ඒකදේශික ශාකයක් වන මෙම ශාකයේ පුෂ්පය සුදු පැහැති ය. ඉතා ප්‍රසන්න සුවඳවත් පුෂ්පයකි. ශාකයේ කඳ කැටයම් කැපීමට යොදා ගනී.

## 4. ඌව පළාත

### ගුරුළු රාජ



අලංකාරය සඳහා නිවෙස්වල වගා කරනු ලැබේ. ඌව පළාතේ ස්වභාවිකව වැඩෙන ශාක විශේෂයකි. දිගට එල්ලී පිපෙන මල් සමූහයකින් යුක්තය.

## 5. මධ්‍යම පළාත

### මහ රත් මල



ඒකදේශික ශාකයකි. උස් කඳුකර ප්‍රදේශවල දැකගත හැකිය. ශාක පත්‍රය ඖෂධ ලෙස යොදා ගනී. කඳේ පොත්ත තද අළු පැහැති ය.

## 6. සබරගමුව පළාත

### වෙසක් මල



ශ්‍රී ලංකාවට ආවේණික (ඒකදේශික) උඩවැඩියා ශාකයකි. අධික වර්ෂාපතනයක් ලැබෙන රත්නපුර ප්‍රදේශයේ වනාන්තරවල දැක ගත හැකිය. විසිතුරු පැළෑටියක් ලෙස ගෙවතුවල වගා කෙරේ.

## 7. බස්නාහිර පළාත

### සුදු නෙලුම්



මෙම පුෂ්පය සුදු පැහැයක් ගනී. නිරතුරුව ම සුවඳ නිකුත් කරන පුෂ්පයකි. ජලජ පැළෑටියකි.

## 8. නැගෙනහිර පළාත

### ගොඩ මානෙල්



මෙය වියළි කලාපයේ තෙත් බිම් ආශ්‍රිතව දක්නට ලැබෙන ශාකයකි. මෙහි පුෂ්ප පිපීම සවස් කාලයේ දී සිදු වේ.

## 9. උතුරු පළාත

### වල් පිච්ච



''වල් කැන්ද'' යන නමින් ද හඳුන්වයි. මෙහි පුෂ්පය බෙහෙවින් සුවඳවත් ය.

## අපට ආවේණික වූ අපේ උරුමයන් ලෙස ගත හැකි දේ

- ➡ ඉපැරණි ස්ථාන/ ගොඩනැගිලි, වෙහෙර විහාර
- ➡ ත්‍රිපිටකය
- ➡ දේශීය කැටයම්
- ➡ නටබුන්
- ➡ ගල් කැටයම් ( මූර්ති , චිත්‍ර , පෙරහැර , ගෘහ භාණ්ඩ , ජන ගීත/ කවි , ක්‍රීඩා )
- ➡ රූකඩ
- ➡ සටන් ක්‍රම ( අංගම්පොර )
- ➡ ගෘහ භාණ්ඩ
- ➡ සිරිත් විරිත් / ආගන්තුක සත්කාර

## ජාතික උරුමයන් මෙන් ම ලෝක උරුමයන් බවට පත් වූ දේවල්

- ✷ ජය ශ්‍රී මහා බෝධිය
- ✷ දළදා මාළිගය
- ✷ සීගිරිය
- ✷ සිංහරාජ වනාන්තරය

## ජාතික උරුමයන් රැක බලා ගැනීමෙන් සිදුවන යහපත් දේ

- තම රටේ අනන්‍යතාවය ආරක්ෂා වීම.
- රටට කීර්තිනාමයක් ගෙන දීම.
- සංස්කෘතිය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කිරීම පහසු වීම.
- මානසික සුවයක් ලැබීම.
- සංස්කෘතික වටිනාකම දිනෙන් දින ඉහළ යාම.

## නූතන සමාජය මඟින් කලාවට සිදු වී ඇති අයහපත් දේවල්

- ➡ කලාව නොසලකා හැරීම.
- ➡ කලාවට හානිකර දේ කිරීම.
- ➡ කලාව අගය නොකිරීම.
- ➡ කලාවේ වටිනාකම හඳුනා නොගැනීම.
- ➡ අවශ්‍ය සම්පත්වල හිඟකම.
- ➡ නූතන පරම්පරාව ඒවා ඉගෙන ගැනීමට අකමැති වීම.
- ➡ විවිධ හස්ත කර්මාන්ත සඳහා භාවිතාවන ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම.



# විවිධ ජාතීන් සහ ආගම් අතර අන්‍යන්‍යතාව පිළිබිඹු කරන ලක්ෂණ දැකිය හැකි අවස්ථා

- ★ මහනුවර දළදා පෙරහැර
- ★ මිහිඳු පෙරහැර
- ★ කතරගම පෙරහැර
- ★ වේල් පෙරහැර
- ★ කැරොල් ගීත සංදර්ශන
- ★ මිලාද් උත්සවය (නබිනායකතුමාගේ උපන් දිනය සැමරීම)
- ★ කතෝලික බැතිමතුන්ගේ දේවස්ථාන මංගල්‍ය
- ★ දොඩම් පෙරහැර (වැදි ජනතාව විසින් ඉතිරිපත් කරන පෙරහැරකි)

## අප රට තුළ ඇති අපට ආවේණික දේවල්

## මහනුවර දළදා පෙරහැර

**※ පැවැත්වීමට හේතුව :-**

සුවාසු දහසක් ධර්මස්කන්ධයෙන් ස්පර්ශ ලැබුවා වූ වම් දළදා වහන්සේට කරන උපහාරයක් හැටියටත්, සිව්මහා දේවාලවල දෙවිවරුන්ට කරන දේව පූජාවක් හැටියටත් මෙම පෙරහැර පවත්වනු ලබනවා.

**※ පැවැත්වෙන කාල සීමාව :-**

අගෝස්තු මාසයේ දී



**※ සංස්කෘතිකාංගවල වැදගත්කම :-**

දේශීය ගායන, වාදන, නර්තන සැරසිලිවලට මෙහි දී ඉතා වැදගත්කමක් හිමි වෙයි.

**※ භාවිතා කරන වාද්‍ය භාණ්ඩ :-**



දවුල



තම්මැට්ටම



හොරණෑව



ගැටබෙරය



පහතරට බෙරය



පන්තේරුව



උඩැක්කිය



අත් රබාන



තාලම්පොට

❊ නැටුම් :-

උඩරට, පහතරට, සබරගමු නැටුම් සම්ප්‍රදායේ නැටුම් මෙයට අයත් වේ. මීට අමතරව අපේ පාරම්පරික ජන නැටුම් රාශියක් ද ඇතුළත් වේ. මහනුවර දළදා මාලිගාවේ පෙරහැර සඳහා කාන්තාවන් නැටුම් හා ඉදිරිපත් කිරීම්වලට සම්බන්ධ නොවේ. එහෙත් සතර මහා දේවාලවල පෙරහැර සඳහා කාන්තාවන් සම්බන්ධ වේ.

## වසරේ වැදගත් ආගමික උත්සව (වසරේ දින දර්ශනයේ මාසවල අනුපිළිවෙළින්)

| උත්සවය | ආගම | මාසය |
|---|---|---|
| තෛපොංගල් | හින්දු | ජනවාරි |
| මහා ශිව රාත්‍රී | හින්දු | මාර්තු |
| අලුත් අවුරුද්ද | බෞද්ධ / හින්දු | අප්‍රේල් |
| මහ සිකුරාදා | කතෝලික | අප්‍රේල් |
| වෙසක් පොහොය | බෞද්ධ | මැයි |
| ඇසළ පොහොය | ඉස්ලාම් | ජූනි |
| රාමසාන් | බෞද්ධ | ජූලි |
| පොසොන් පොහොය | බෞද්ධ | ජූලි |
| හජ්ජි | ඉස්ලාම් | අගෝස්තු |
| දීපවාලි | හින්දු | ඔක්තොම්බර් |
| මීලාදුන් නබිනායක උත්සවය | ඉස්ලාම් | නොවැම්බර් |
| උඳුවප් පොහොය | බෞද්ධ | දෙසැම්බර් |
| නත්තල් | කතෝලික | දෙසැම්බර් |

## වසරේ වැදගත් ජාතික උත්සව

| උත්සවය | මාසය |
|---|---|
| නිදහස් දිනය / ජාතික දිනය | පෙබරවාරි 04 |
| මැයි දිනය (ලෝක කම්කරු දිනය) | මැයි 01 |
| ජාතික වීර දිනය | මැයි 22 |



ජාතීන්, ජනවර්ග ලෙස නොව
ශ්‍රී ලාංකිකයන් ලෙස
අපි එකට එකතු වෙමු.



## ශ්‍රී ලංකාවට ආවේණික ජන කවි



- නැළවිලි කවි
- රබන් පද
- ඕංචිලි වාරම්
- නෙළුම් කවි
- පතල් කවි
- කරත්ත කවි
- පාරු කවි
- පැල් කවි
- සංවාදාත්මක කවි

## ජන ක්‍රීඩා



- පංච දැමීම.
- ඔළිඳ කෙළිය
- එළුවන් කෑම
- අං කෙළිය
- තාච්චි පැනීම
- පොර පොල් ගැසීම
- රබන් ගැසීම
- වළකපු ගැසීම

## ශ්‍රී ලාංකිකයන් ලෙස අන් අයගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමට අපට කළ හැකි දේවල්

- සියලු ආගම් සඳහා ගරු කිරීම.
- අන් අයගේ සංස්කෘතික අංග අගය කිරීම.
- සහයෝගයෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීම.
- උදවු අවශ්‍ය විට උදවු කිරීම.



## ආගමික / ජාතික වශයෙන් සහයෝගිතාව පෙන්වන අවස්ථා

- ★ සියලු ම බැතිමතුන් සිරිපා වන්දනා කිරීම.
- ★ කතරගම වන්දනා කිරීම.
- ★ සිල් සමාදන් වූ අයට දානය පිරි නැමීම.
- ★ අවුරුදු කැවිලි පෙවිලි අන්‍යාගමිකයන් හා අන්‍ය ජාතිකයන් සමඟ බෙදාහදා ගැනීම.

## විවිධ ආගම්වල ආගමික නායකයින් හා ආගමික සංකේත

බෞද්ධ



ධර්ම චක්‍රය - ගෞතම බුදුන් වහන්සේ

ක්‍රිස්තියානි



කුරුසය - යේසුස් ක්‍රිස්තුස් වහන්සේ

හින්දු



ත්‍රිශූලය - ශිව දෙවියන්

ඉස්ලාම්



අඩ සඳ සහ තරුව - අල්ලාහ් දෙවියන්

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන කොටස් හඳුනා ගනිමු.

1) සිංහල



සිංහල පිරිමි අයගේ ඇඳුම ජාතික ඇඳුමයි. එය ආර්ය සිංහල ඇඳුම ලෙසත් හඳුන්වනවා. සිංහල කාන්තාවන් ඔසරියත්, බෝර්ච්චි අත් යෙදූ හැට්ටයත් අඳිනු ලබති

2) දෙමළ



දෙමළ පිරිමි අය වේට්ටිය හා බැනියම අඳිති. මීට අමතරව නළලේ අළුවලින් ඉරි සටහන් කර ගෙන සිටිති. දෙමළ කාන්තාවන් ඉන්දියානු සාරිය හා හැට්ටය අඳිති. මීට අමතරව නළලේ තිලකය තබති. හිසෙහි මල් ගැවසීම ද ඔවුන්ට ආවේණික ලක්ෂණයකි.

3) මුස්ලිම්



මුස්ලිම් පිරිමි අය ජුබ්බා නම් ඇඳුම සමඟ තොප්පිය පළඳිති. මුස්ලිම් ජාතික කාන්තාවෝ හබායා නම් ඇඳුම අඳින අතර, හිසට ඉජාභාප් නම් පළඳනාව ද පළඳිති. පාසල් යන ගැහැනු ළමයි පර්දා නමැති ඇඳුම අඳිති.

4) බර්ගර්



බර්ගර් ජාතික පිරිමි අය යුරෝපීය ඇඳුම අඳිති. එයට කලිසම, කමිසය, කබාය හා කර පටිය ඇතුළත් ය. බර්ගර් ජාතික කාන්තාවෝ යුරෝපීය කාන්තාවන්ගේ ඇඳුම වන ගවුම අඳිති.

## විවිධ ජාතීන්ගේ ආචාර විධි

1. සිංහල - දෑත එක් කොට 'ආයුබෝවන්'' යැයි කීම.
2. දෙමළ - දෑත් එක් කොට ''වණක්කම්'' යැයි කීම.
3. මුස්ලිම් - 'අස්සලාම් අලෛක්කුම්'' යැයි කීම.

## විවිධ ජාතීන් අදහන ආගම්

1. සිංහල - බෞද්ධ ආගම / කතෝලික ආගම
2. දෙමළ - හින්දු ආගම
3. මුස්ලිම් - ඉස්ලාම් ආගම

## විවිධ ජාතීන්ගේ ආගමික උත්සව

1. බෞද්ධ - වෙසක්, පොසොන්, ඇසළ, කඨින පිංකම්, උපසම්පදා උත්සව, කුල දරුවන් පැවිදි කිරීමේ උත්සව
2. කතෝලික - නත්තල්, අළු බදාදා, පාස්කු, මහ සිකුරාදා, පල්ලියේ මංගල්‍ය
3. දීපවාලි - දීපවාලි, තෛපොංගල්, තේරු උත්සව, වේල් උත්සව, මහා ශිව රාත්‍රී උත්සවය
4. ඉස්ලාම් - හජ්ජි උත්සවය, මිලාදුන් නබිනායකතුමාගේ උත්සවය, රාමසාන් උත්සවය



සියලු ම ජාතීන් පොදුවේ සමරන උත්සව ජාතික උත්සව ලෙස හඳුන්වනු ලබනවා. නිදහස් දින උත්සවය ජාතික උත්සවයකි. සිංහල-හින්දු අලුත් අවුරුදු උත්සවය ඒ දෙපාර්ශවයට ම පොදු වූ උත්සවයකි.

## විවිධ ජාතීන්ගේ ආහාර වර්ග

1. සිංහල - කිරිබත්, කොණ්ඩ කැවුම්, මුං ගුළි, මුං කැවුම්
2. දෙමළ - තෝසේ, සාම්බාරු හොදි, වඩේ, ඉට්ලි, ලඩ්ඩු, මුරුක්කු
3. මුස්ලිම් - බුරියානි, පරාටා, වටලප්පන්, බූන්දි
4. බර්ගර් - ලම්ප්රයිස්, කේක්, රෝල්ස්, පැටිස්, කට්ලට්

## විවිධ ආගම් අදහන පූජනීය ස්ථාන

බෞද්ධ



පන්සල

කතෝලික



පල්ලිය / දේවස්ථානය

හින්දු



කෝවිල

ඉස්ලාම්



මස්ජිදය

## විවිධ ආගම්වලට අයත් පූජකවරු

බෞද්ධ



ස්වාමීන් වහන්සේ

කතෝලික



පූජකතුමා

හින්දු



හින්දු පූජකවරයා

ඉස්ලාම්



ඉස්ලාම් පූජකතුමා

## ❊ ශ්‍රී ලාංකිකයන් ලෙස කටයුතු කළ යුතු ආකාරය ගැන කියවෙන ගීතයක්



දකුණ නැගෙනහිර බටහිර උතුරද
එක කොඩියේ සෙවණේ
එකම දැයක් වී මහ බලයක් වී
පෙරටම යමු ලංකා ලංකා

ඉපැදුණු අප හට ලක් පොළවේ...

වැටුනත් නැගිටිමු වැටි වැටි නැගිටිමු
නැග නැග යමු දියුණේ
බාධා වලටද බාධා ගෙනදී
පෙරටම යමු ලංකා ලංකා

ඉපැදුණු අප හට ලක් පොළවේ...

වීර විකුම් පෑ ආදී මුතුන් ගිය
පාර අපේ උරමේ
දැර ඔවුන් මඟ සූර ලෙසින් වැද
පෙරටම යමු ලංකා ලංකා

ඉපැදුණු අප හට ලක් පොළවේ...

දක්වමු දස්කම් ලක්කම් විස්කම්
විස් මවමින් මුළු ලෝ...//

ගායනය : අයිවෝ ඩෙනිස්

අප උපන් රටට ආදරය කිරීමටත්, අපට හැකි උපරිම අයුරින් රටට සේවය කිරීමටත් අපි හොඳින් මතක තබා ගත යුතුය. අපේ මව්බිමට ගෞරව දැක්විය යුතු, හැම ආකාරයකින් ම අපි ලක් මවට ගරු කළ යුතුය.

**අප රට විදේශිකයන්ට යටත් කර ගනු ලැබුවේ වැරදි ක්‍රියා පුරුදු පුහුණු කිරීම මගිනි.**

ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ බටහිර ජාතීන් පැමිණි කාලයන්
පෘතුග්‍රීසීන් - ක්‍රි. ව. 1505
ලන්දේසීන් - ක්‍රි. ව. 1658
ඉංග්‍රීසීන් - ක්‍රි. ව. 1796



යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැගලා.............
( හටන් කාව්‍යවලින් උපුටා ගැනීමකි)

# අපේ රටට විශිෂ්ට සේවයක් කළ පුද්ගලයෝ.....



අනගාරික ධර්මපාලතුමා



ආනන්ද සමරකෝන්



කුමාරතුංග මුනිදාස



එස්.මහින්ද හිමි



ආනන්ද රාජකරුණා



ආතර් වී.දියෙස්



සී.ඩබ්.ඩබ්. කන්නන්ගර



හෙන්රි ස්ටීල් ඕල්කට්



පොන්නම්බලම් අරුනාචලම්



හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි



කේ.ජයතිලක



මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි



පියදාස සිරිසේන



වීරපුරන් අප්පු



මුත්තු කුමාරස්වාමි



වලිසිංහ හරිස්චන්ද්‍ර

## අපට සේවා සපයන රාජ්‍ය ආයතන

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. ලංකා විදුලි බල මණ්ඩලය
3. නගර සභාව
4. ශ්‍රී ලංකා ටෙලිකොම්
5. රාජ්‍ය බැංකු
6. රෝහල
7. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## අපට සේවා සපයන පුද්ගලික ආයතන

1. පෞද්ගලික බැංකු
2. සුපිරි වෙළඳසැල්
3. වාහන සේවා ආයතන
4. පෞද්ගලික දුරකථන සේවා ආයතන
5. වෙළඳසැල්
6. ත්‍රීරෝද රථ සංගම්
7. කුලී රථ සංගම්
8. පෞද්ගලික මූල්‍ය ආයතන

## ජාතික අභිමානය දනවන කවි / ගී

1. ''මේ සිංහල අපගේ රටයි - අප ඉපදෙන මැරෙන රටයි''
   **(නන්දා මාලනී)**
2. ''රත්න දීප ජන්ම භූමි - ලංකා දීප විජය භූමි''
   **(පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව)**
3. ''හෙළ ජාතික අභිමානේ''
   **(සී.ටී.ප්‍රනාන්දු)**
4. ''පෙරදිග මුතු ඇටයයි මේ - ලෝකේ සිරිබර සිරි ලංකා''
   **(ලතා වල්පොල / ධර්මදාස වල්පොල)**
5. ''ලංකා ලංකා පෙම්බර ලංකා - පිනවමු ඔබ ලංකා''
   **(සුනිල් ශාන්ත)**

## ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය මතු කරන කවි / ගී

1. ''අභිමානනීය වූ නවෝදයේ හිරු හෙට උදයේ පායනවා''
   **(අයිවෝ ඩෙනිස් )**
2. ''මට මෑණි වගේ - මට පියා වගේ''
   **(රුවන් ශ්‍රී ලාල් දල්පදාදු)**
3. ''සඳ මඬලේ සිට තරු මඬලේ සිට දිවැස් හෙළන පුතුනේ''
   **( මාලනී බුලත්සිංහල)**



# අප රට තුළ ආවේණික විවිධ නිර්මාණ සැරසිලි











# බට්ටා පනිමු ක්‍රීඩාව






2,3,4 සහ 5 ශ්‍රේණි සඳහා zoom ඔන්ලයින් පන්ති වලට සහභාගී වීමට
071 6684251 අංකයට WhatsApp පණිවිඩයක් එවන්න.